**2019 වර්ෂයට භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම**

**පළාත් මහ රෝහල - බදුල්ල**

බදුල්ල පළාත් මහ රෝහලට, 2019 වර්ෂය වෙනුවෙන් පහත දැක්වෙන අයිතමයන් යටතේ භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීමට සුදුසුකම් සපුරා ඇති රජයේ ආයතන, පුද්ගලික ආයතන, සමිති හා පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවන බව මෙයින් දන්වා සිටිමි.

02. සියලුම සැපයුම් රෝහල වෙත ගෙනවිත් භාරදිය යුතු අතර ඊට අදාල අනෙකුත් කොන්දේසි පරීක්ෂා කර බලා ඒ සඳහා වන අයදුම්පත් 2018-10-08 වන දින සිට 2018-10-23 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා කාර්යාල වේලාවන් තුල එක් අයිතමයකට රු.200.00 බැගින් ගෙවා රෝහල් කාර්යාලයෙන් ලබා ගත හැක. අයදුම්පත් ලබා ගැනීම සඳහා ව්‍යාපාරය ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපතක් සමග ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කල යුතුය. ලබාගත් අයදුම්පත් සම්පූර්ණ කර 2018-10-23 දින පස්වරු 2.30ට පෙර පහත ලිපිනයට එවිමට හෝ මහ රෝහලේ ටෙන්ඩර් පෙට්ටියට බහලිය හැක.

03. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහල කෙලවරේ **"2019 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම"** යනුවෙන් සඳහන් කර එවිය යුතු අතර, 2018-10-23 දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ කොන්දේසි www.badullapgh.org වෙබ් අඩවියෙන්ද ලබා ගත හැකිය.

01. **භාණ්ඩ සැපයීම**

1. ලිපිද්‍රව්‍ය
2. ලිපි ද්‍රව්‍ය නොවන අනෙකුත් පාරිභෝජ්‍ය ගබඩා ද්‍රව්‍ය (සබන්, බැටරි වර්ග, ඉදල්, කොසු, විෂ බීජ නාශක වැනි)
3. රෙදිපිළි වර්ග සැපයීම
4. කාර්යාල උපකරණ (ජායාපිටපත් යන්ත්‍ර, අනු පිටපත් යන්ත්‍ර, ගණක යන්ත්‍ර වැනි)
5. ගෘහභාණ්ඩ (දැව/වානේ) වර්ග (මේස, පුටු, කබඩ්, ලිපිගොනු කබඩ් වැනි)
6. රෝහල් ගෘහ භාණ්ඩ වර්ග (රෝහල් ඇඳන්,සේලයින් ස්ටෑන්ඩ්,රෝහල් ස්ටූල වැනි)
7. බෙහෙත් ලිපිකවර
8. මෙට්ට වර්ග (රෙක්සින්,කුෂන්,රබර් මිශ්‍රිත කොහු මෙට්ට වැනි)
9. පරිගණක හා පරිගණක උපාංග
10. ටයර්, ටියුබ්
11. බැටරි
12. වාහන අමතර කොටස්
13. ගොඩනැගිලි ද්‍රව්‍ය,ජල නල හා උපාංග සහ විදුලි උපාංග
14. විද්‍යුත් උපකරණ සහ යාන්ත්‍රික උපකරණ
15. ඖෂධ වර්ග
16. රෝහල් වෛද්‍ය/ශල්‍ය උපකරණ හා උපාංග
17. රෝහල් රසායනාගාර උපකරණ හා උපාංග
18. රෝහල් රසායනාගාර උපකරණවලට අවශ්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය(Reagents)
19. විකලාංග උපකරණ සෑදීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය
20. ලී, ලෑලි හා දැව සැපයීම
21. සුදු යකඩෙන් නිමවන ලද භාණ්ඩ සැපයීම
22. ගාබේජ් බෑග් (කහ,කළු හා කොළ වර්ණයන්)

02. **සේවාසැපයුම්**

1. ගොඩනැගිලි නඩත්තු කටයුතු (ICTAD ලියාපදිංචි වී සිටියයුතුය)
2. වාහන අළුත්වැඩියාවන්
3. පරිගණක හා පරිගණක මුද්‍රණ යන්ත්‍ර අළුත්වැඩියාවන්
4. විදුලි උපකරණ හා විද්‍යුත් උපකරණ අළුත්වැඩියාවන්
5. ගෑස් ලිප් හා ගෑස් උපකරණ අළුත්වැඩියාවන්
6. ඇළුමිනියම් උපකරණ හා පිත්තල උපකරණ අළුත්වැඩියාවන්
7. තිරරෙදි ,දොරරෙදි, ජනෙල් රෙදි සපයා සවිකිරීම
8. රබර් මුද්‍රා සෑදීම
9. ශීතකරණ/ වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියාවන්
10. ජායා පිටපත් යන්ත්‍ර,ඩුප්ලෝ මැෂින් හා රෝනියෝ මැෂින් අළුත්වැඩියාව
11. ජල හා පල්දෝරු පොම්ප අළුත්වැඩියාවන්
12. යකඩ හා වානේ පෑස්සුම් වැඩ
13. පොත්පත්, ලිපි, ස්ටිකර්, බැනර්, නාම පුවරු හා ආකෘතිපත්‍ර මුද්‍රණය
14. රාජකාරි හැඳුනුම්පත් සකස් කරවා ගැනීම

විමසීම්:- 055-2223980
055-2222261/62(ex 1113)
ෆැක්ස් අංකය:-055-2231205
ඊමේල් :-info@badullpgh.org

සභාපති,
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,
පළාත් මහරෝහල, බදුල්ල.

## 2019 වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම
## පළාත් මහ රෝහල - බදුල්ල

### ලියාපදිංචි කර ගැනීමේ පොදු කොන්දේසි

බදුල්ල පළාත් මහ රෝහල වෙත 2019 වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සැපයුම් වෙනුවෙන් ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් සඳහා කොන්දේසි පහත පරිදි වේ.

01. අපේක්ෂිත අයදුම්කරුවන් පුවත් පත් දැන්වීම අනුව තමන් සැපයීමට බලාපොරොත්තු වන අයිතමය සඳහා ව්‍යාපාර ලියාපදිංචිය යටතේ ලියාපදිංචි වී තිබිය යුතුය..

02. ඒ අනුව, අයදුම්පත් ලබා ගැනීමේදී අයදුම්කරුවන් විසින් පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කල යුතුය.

1 අයදුම්පත් ලබා දෙන ලෙස ඉල්ලා අදාල ආයතනය/පුද්ගලයා විසින් නිකුත් කරන ලද ලිපියක්

11 ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ ජායා පිටපතක්

03. අයදුම්කරුවන් සැපයීමට බලාපොරොත්තු වන භාණ්ඩ හා සේවාවන් පිළිබඳ විස්තර තම අයදුම්පතේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

04. සම්පූර්ණ කරන ලද අයදුම්පත් බදුල්ල පළාත් මහ රෝහල වෙත ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් ලියකියවිලි සමග ඉදිරිපත් කල යුතුය

1 රෝහලෙන් නිකුත් කරන ලද ලදුපතේ සත්‍ය ජායා පිටපතක්

11 ඔබ කිසියම් නිෂ්පාදකයෙකු හෝ විදේශීය නිෂ්පාදන ආයතනයක බලයලත් එකම නියෝජිත ආයතනය වන්නේ නම්, නිෂ්පාදන ආයතනය හෝ එකම නියෝජිත ආයතනය බව සනාථ කරන සහතිකයේ ජායා පිටපතක්

111 ආවරණය වන බල ප්‍රදේශය (මුළු ලංකාවටමද නැතිනම් විශේෂිත කලාපයකට ද යන වග, ඇතුළත් සහතිකයේ ජායා පිටපතක්)

1V ගොඩනැගිලි නඩත්තු කොන්ත්‍රාත්කරුවන් සඳහා ICTAD ලියාපදිංචි සහතිකය

05. සියලුම අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු ලියාපදිංචි කරගනු ලැබේ.

06. භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් සඳහන් කරන ලිපිනයේ ස්ථිරවම ව්‍යාපාරය පවත්වාගෙන යා යුතු අතර සියලුම සංදේශන කටයුතු සිදු කරනු ලබන්නේ අයදුම්පතේ සඳහන් ස්ථිර ලිපිනය සඳහා පමණි. ලිපිනයෙහි වෙනස් වීමක් සිදු වුවහොත්, වහාම නව ලිපිනය දැන්විය යුතුය. එසේ නොවන සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය අවලංගු කිරීමේ බලය බදුල්ල පළාත් මහ රෝහලේ අධ්‍යක්ෂ සතුවේ.

07. සියලුම සැපයුම්කරුවන්ගෙන් තෝරාගත් සැපයුම්කරුවන් 05 දෙනෙකුගෙන් පමණක් හෝ මිළ ගණන් කැඳවීමට අධ්‍යක්ෂ වෙත බලතල ඇත්තේය.

08. අසාධු ලේඛණයට ඇතුලත් වූ කිසිදු භාණ්ඩ හා සේවා සැපයුම්කරුවකු ලියාපදිංචි කරගනු නොලැබේ.

09. මිළ ගණන් ඉදිරිපත් කිරීමේදී සියලු මිළ ගණන් ඉදිරිපත් කල යුත්තේ අදාල සැපයුම් බදුල්ල පළාත් මහ රෝහල වෙත ගෙනවිත් භාරදීම සඳහා වන අතර, එම මිළ ගණන් ඉදිරි මාස තුනකටවත් (03)වලංගු විය යුතුය. ඇණවුම අනුව සැපයීමට නියමිත දින රෝහල වෙත අදාළ භාණ්ඩ හෝ සේවා සපයනු නොලැබුවහොත්, එය එම ඇණවුම අවලංගු කිරීමට හේතුවක් වන අතර, එසේ සැපයීම් ප්‍රතික්ෂේප කරන සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබේ.එසේම, යම් අයිතමයක සාම්පල පරීක්ෂා කිරීමට තීරණය කළහොත්, අදාල සාම්පල නියමිත දිනට රෝහල වෙත ගෙනවිත් ඉදිරිපත් කළ යුතුය.

10. මිළ ගණන් කැඳවීමේදී පිට පිටම අවස්ථා 03ක් මිළ ගණන් ඉදිරිපත් නොකරන ආයතනයන්ගෙන් නැවත මිළ ගණන් කැඳවනු නොලැබේ.

11. ගොඩනැගිලි නඩත්තු කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේදී රු: 150,000.00 ක වාණිජ බැංකුවකින් ලබා ගත් කාර්ය සාධන ඇපකරයක් හෝ මුදලින් රෝහල වෙත තැන්පතු කළ යුතු වන අතර, ගොඩනැගිලි නඩත්තු කොන්ත්‍රාත් ගිවිසුමකටද එළඹිය යුතුය.

12. 2018 වර්ෂයේ සැපයුම් අසතුටුදායක සැපයුම්කරුවන් ලියාපදිංචි කරගනු නොලැබේ.

13. සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීමේ අවසාන තීරණය බදුල්ල පළාත් මහ රෝහල අධ්‍යක්ෂ සතු වන්නේය.

14. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහල කෙලවරේ “**2019 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම**“ යනුවෙන් සඳහන් කර එවිය යුතු අතර, ලිපි කවරයේ වම්පස පහල කෙලවරේ ආයතනයේ නම සහ ලිපිනය සඳහන් කල යුතුය.

ඉහත සඳහන් සියලු කරුණු සැලකිල්ලට ගෙන ඔබගේ ලියාපදිංචිය ලබාගත යුතුය.

(අයදුම්පත් ලබා ගැනීමට චෙක්පත්/ මුදල් ඇණවුම් ඉදිරිපත් කරන්නේ නම් එම චෙක්පත්/ මුදල් ඇණවුම් නිෂ්කාශනය වූ පසු අයදුම්පත් නිකුත් කෙරේ.)

අධ්‍යක්ෂ,
පළාත් මහ රෝහල,
බදුල්ල.

2018-10-08 වන දින
බදුල්ල, පළාත් මහ රෝහලේදීය.